1983 දී රාජ්‍ය ණයමත පොළී ගෙවීම්, රුපියල් දශ ලක්ෂ 5,314 ක් දේශීය ණය මත පොළී ගෙවීම්වලින් ද, රුපියල් දශ ලක්ෂ 1,279 ක් විදේශීය ණය මත පොළී ගෙවීම්වලින් ද සමන්විත විය. වසර තුළදී දේශීය ණය මත පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 27 කින් වැඩි වූ අතර, විදේශීය ණය මත ගෙවීම් සියයට 40 කින් ඉහළ නැගුණි. දේශීය ණය මත පොළී ගෙවීම්, රුපියල් ණය සඳහා රුපියල් දශ ලක්ෂ 3,228 කින් ද, භාණ්ඩාගාර බිල්පත් මත රුපියල් දශ ලක්ෂ 2,082 කින් ද, විදේශීය පරිපාලන ණය මත රුපියල් දශ ලක්ෂ 3 කින් ද සමන්විත විය. රුපියල් ණය සඳහා පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 49 ක වැඩිවීමක් වාර්තා කළ අතර, භාණ්ඩාගාර බිල්පත් සඳහා පොළී ගෙවීම් සියයට 4 කින් වැඩි විය. පරිපාලන ණය මත පොළී ගෙවීම් නොවෙනස්ව පැවතුණි. විදේශීය ණය සඳහා පොළී ගෙවීම්, ව්‍යාපෘති ණය සඳහා රුපියල් දශ ලක්ෂ 299 කින් ද, භාණ්ඩ ණය සඳහා රුපියල් දශ ලක්ෂ 441 කින් හා වෙනත් ණය සඳහා රුපියල් දශ ලක්ෂ 539 කින් ද සමන්විත විය. ව්‍යාපෘති ණය සහ භාණ්ඩ ණය මත පොළී ගෙවීම් පිළිවෙලින් සියයට 39 කින් සහ සියයට 27 කින් වැඩිවූ අතර, වෙනත් ණය මත පොළී ගෙවීම් පසුගිය වසරට වඩා සියයට 53 කින් ඉහළ නැගුණි. වෙනත් ණය යටතේ වූ යූරෝ මුදල් ණය සඳහා මුළු පොළී ගෙවීම් 1983 දී රුපියල් දශ ලක්ෂ 497 ක් වූ අතර, 1982 දී රුපියල් දශ ලක්ෂ 344 ක් ද, 1981 දී රුපියල් දශ ලක්ෂ 252 ක් ද සහ 1980 දී රුපියල් දශ ලක්ෂ 4 ක් ද විය. යූරෝ මුදල් වෙළෙඳ ණය ගිවිසුම් 3 ක් මත එම ණය ලබා ගන්නා ලදී. පළමු ණය මුදල වූ අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 50, 1980 දී ලබාගත් අතර,එයට අදාළ පොළී අනුපාතය ණය ආපසු ගෙවීම් සඳහා ඉඩ දෙන ලද සිව් වසරක සහන කාලය සඳහා ලන්ඩන් අන්තර් බැංකුවල බලපවත්වන ලද අනුපාතය (ල.අ.බැං.අ.) සහ සියයට 0.875 ක්ද, ඉතිරි සිව් වසර සඳහා ල.අ.බැං.අ. සහ සියයට 1 ක් ද වේ. 1981 දී ලබාගන්නා ලද අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 75 ක් වූ දෙවැනි ණය සඳහා පොළිය පළමු අවුරුදු හය සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.625 ක් ද, ඉතිරි අවුරුදු දෙක සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.75 ක් ද වේ. මෙම ණය ආපසු ගෙවීම සඳහා දෙන ලද සහන කාලසීමාව අවුරුදු 5 කි. 1982 දී ගිවිස ගන්නා ලද අමෙරිකානු ඩොලර් දශ ලක්ෂ 100 ක් වටිනා තුන්වැනි ණය මුදල 1982 සහ 1983 වර්ෂවලදී කොටස් වශයෙන් ලබා ගන්නා ලදී. මෙම ණය සඳහා පොළිය පළමු අවුරුදු 2 සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.5 ක්ද, ඉතිරි අවුරුදු 6 සඳහා ල.අ.බැං.අ. සහ සියයට 0.625 ක්ද වේ. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා දෙන ලද සහන කාලසීමාව අවුරුදු 5 කි. ලබා නො ගත් ණය ප්‍රමාණයන් වෙනුවෙන් ගෙවිය යුතු බැඳීම් ගාස්තුව පළමුවැනි සහ දෙවැනි ණය සඳහා සියයට 0.5 ක් වූ අතර, තුන්වැනි ණය සඳහා සියයට 0.375 ක් විය. ජපානයේ යෙන් ණය මුදල සඳහා පොළී ගෙවීම් 1983 දී රුපියල් දශ ලක්ෂ 29 ක් වූ අතර, 1982 දී එය රුපියල් දශ ලක්ෂ 0.3 ක් විය. මෙම ණය සඳහා වාර්ෂික පොළී අනුපාතය සියයට 9.4 ක් වූ අතර, පස් අවුරුදු සහන කාලසීමාව ද ඇතුළත්ව ණය ආපසු ගෙවීමේ කාලය අවුරුදු 15 ක් වේ.


## මුදල් සහ බැංකු කටයුතු

### මුදල් සැපයුම

1983 වර්ෂයේදී ආසන්න මුදල් හි පහත් වර්ධන වේගයත් සමග එක් වූ පුළුල් මුදල් සැපයු-මෙහි ($M_2$) වර්ධනයක් දක්නට ලැබුණි. පටු මුදල් සැපයුම ($M_1$) මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතුවලින් සමන්විත වන අතර, ආසන්න මුදල්හි වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු ඇතුළත් වේ. 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 1,735 ක හෙවත් සියයට 17 ක වැඩිවීමක් හා සසඳන විට වර්ෂය තුළදී $M_1$ රුපියල් දශ ලක්ෂ 2,988 කින් හෙවත් සියයට 25 කින් වැඩිවූ අතර, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 4,328 ක හෙවත් සියයට 30 ක වර්ධනය හා සසඳන කල, ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 3,759 කින් හෙවත් සියයට 20 කින් වර්ධනය විය. වෙළෙඳ බැංකු විසින් තැන්පතු පොළී අනුපාතිකයන් පහළ දැමීම හේතුකොට ගෙන අනෙකුත් තැන්පතු රාශීකරණ ආයතන කරා තැන්පතු ගලා යාම ආසන්න මුදල්හි වර්ධන අනුපාතය අඩුවන්නට තරමක් දුරට හේතු විය. 1982 වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 6,063 ක හෙවත් සියයට 25 ක වර්ධනය හා සසඳන විට පටු මුදල් සැපයුම

## මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

හා වෙළෙඳ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු වලින් සැකසෙන පුළුල් මුදල් සැපයුම ($M_2$) රුපියල් දශ ලක්ෂ 6,747 කින් හෙවත් සියයට 22 කින් වැඩි විය.

1982 දී වූ රුපියල් දශ ලක්ෂ 1,165 (සියයට 24 ) ක වර්ධනය සමග සසඳනවිට 1983 දී මහජනයා සතු ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 1,212 (සියයට 20) කින් වැඩි විය. අප්‍රේල් සහ දෙසැම්බර් යන මාසවල උත්සව කාල සඳහා ව්‍යවහාර මුදල් ලඟ තබා ගැනීමට මහජනයා දක්වූ වැඩි කැමැත්ත පැහැදිලි කරමින්, ඉහළම මාසික වර්ධනයක් මාර්තු සහ දෙසැම්බර් යන මාසවලදී සිදු වූ අතර, එම මාසවලදී ව්‍යවහාර මුදල් හි මාසික වර්ධනය පිළිවෙලින් සියයට 10 හා සියයට 6 බැගින් විය. අනෙක් අතට, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 571 (සියයට 11) ක අඩු වර්ධනය හා සසඳනවිට මහජනයා සතු ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,776 (සියයට 31) කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස වර්ෂය තුළදී සියයට 49 සිට 51 දක්වා වැඩි විය. ඒ අනුව $M_1$ හි ව්‍යවහාර මුදල් කොටස 1982 දී වූ සියයට 51 සිට 1983 දී සියයට 49 දක්වා අඩු විය.

නිරපේක්ෂ වශයෙන් බලන කල, පසුගිය වසර කිහිපය තුළ (1983 මැයි හා අගෝස්තු හැරුණ විට) ආසන්න මුදල් නොකඩවා වැඩි වෙමින් පැවතිය ද,එහි වර්ධන අනුපාතය අඩුවීමේ උපනතියක් දක්විණ. 1983 දී ආසන්න මුදල්හි වර්ධනය ප්‍රධාන වශයෙන්ම, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 2,815 (සියයට 25) ක වර්ධනයට එරෙහිව රුපියල් දශ ලක්ෂ 3,824 (සියයට 27) කින් වර්ධනය වූ අනෙකුත් පෞද්ගලික අංශයේ (නියම පෞද්ගලික අංශය) කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු හේතුකොටගෙන සිදුවූවකි.

ආසන්න මුදල්හි වර්ධන වේගයෙහි අඩුවීම, රාජ්‍ය සංස්ථාවල තැන්පතු ප්‍රමාණය සැළකිය යුතු ලෙස අඩුවීමක් මගින් සම්පූර්ණයෙන්ම පිළිබිඹු විය. 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 1,489 (සියයට 54) ක වර්ධනය සමග සසඳනවිට මෙම තැන්පතු 1983 දී රුපියල් දශ ලක්ෂ 177 (සියයට 4) කින් පහත වැටුන අතර, මෙය වැඩි වශයෙන්ම දක්නට ලැබුනේ වර්ෂයේ අවසාන භාගයෙහිදීය. මේ අතර, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 23 (සියයට 7) ක අඩු වර්ධනයට ප්‍රති-විරුද්ධව සමුපකාර ආයතනයන්හි කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 112 (සියයට 31) කින් තියුණු ලෙස වර්ධනය විය.

1983 වර්ෂයේදී මූල්‍ය වර්ධනයෙහි අඩුවීම දේශීය ණයෙහි වර්ධන වේගය අඩු වීමෙන් තරමක් දුරට පිළිබිඹු විය. 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 8,431 (සියයට 25 ) ක වර්ධනය සමග සසඳන විට 1983 දී දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 6,895 (සියයට 16 ) ක් විය. මේ අතර, මූල්‍ය සමස්තයන් මත දේශීය ණය මගින් ඇති කරන ලද බලපෑම, විදේශීය බැංකු වත්කම් රුපියල් දශ ලක්ෂ 815 (සියයට 34) කින් වැඩිවීම මගින් තවදුරටත් ශක්තිමත් කෙරුණි. කෙසේ හෝ, මේ සංවර්ධනයන් මගින් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම, රුපියල් දශ ලක්ෂ 964 කින් අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) වැඩිවීම මගින් පිළිබිඹු වූ වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් හි විශාල වැඩිවීම මගින් තරමක් දුරට මධ්‍යස්ථ කෙරුණි.

දේශීය ණය ප්‍රසාරණය වූ කලී රජයට දෙන ලද ශුද්ධ ණය සහ පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි සංයුක්ත ප්‍රතිඵලයක් විය. මෙයින් රජයට දෙන ලද ශුද්ධ ණය, පසුගිය වර්ෂයෙහි වූ සියයට 34 ක වර්ධනයට ප්‍රතිවිරුද්ධව රුපියල් දශ ලක්ෂ 383 ක හෙවත් සියයට 2 ක වර්ධනයක් වාර්තා කළේය. 1983 දී අත්දකින ලද ඉතා වැදගත් ලක්ෂණයක් නම් බැංකු ක්‍රමය මත රජයේ රඳා පැවැත්මෙහි අඩුවීමක් පිළිබිඹු කරමින්, මුළු දේශීය ණයෙන් රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය 1982 දී වූ සියයට 40 සිට 1983 දී සියයට 36 දක්වා සැළකිය යුතු ලෙස අඩු වීමයි.

## 1 . 50 සංඛ්‍යා සටහන
## මූල්‍ය සමස්තයන් 1981—1983

(ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ)

| කාලච්ඡේදය අවසානයේදී | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1981 | 1982 | 1983 | වෙනස % (1980/ 1981) | වෙනස % (1981/ 1982) | වෙනස % (1982/ 1983) | 1981 | 1982 | 1983 | වෙනස % 1980/1981 | වෙනස % 1981/1982 | වෙනස % 1982/1983 |
| ජනවාරි .. | 9,208 | 11,046 | 11,852 | + 17·3 | + 20·0 | + 7·3 | 20,532 | 26,890 | 30,802 | + 35·8 | + 31·0 | + 14·5 |
| පෙබරවාරි .. | 9,288 | 11,178 | 12,234 | + 17·9 | + 20·4 | + 9·4 | 20,199 | 26,758 | 31,708 | + 30·4 | + 32·5 | + 18·5 |
| මාර්තු .. | 10,125 | 11,671 | 12,986 | + 20·9 | + 15·3 | + 11·2 | 21,984 | 28,240 | 32,874 | + 36·9 | + 28·5 | + 16·4 |
| අප්‍රේල් .. | 9,573 | 11,276 | 12,842 | + 14·2 | + 17·8 | + 13·9 | 21,555 | 28,395 | 33,114 | + 31·6 | + 31·8 | + 16·6 |
| මැයි .. | 9,168 | 11,132 | 12,606 | + 10·6 | + 21·5 | + 13·2 | 21,437 | 29,128 | 32,491 | + 31·3 | + 35·9 | + 11·5 |
| ජුනි .. | 9,033 | 10,815 | 12,589 | + 9·1 | + 19·8 | + 16·4 | 21,681 | 28,739 | 32,798 | + 32·0 | + 32·6 | + 14·1 |
| ජූලි .. | 9,097 | 10,710 | 12,964 | + 11·0 | + 17·8 | + 21·4 | 22,065 | 28,459 | 33,846 | + 32·5 | + 29·0 | + 18·9 |
| අගෝස්තු .. | 9,197 | 10,892 | 12,977 | + 11·6 | + 18·5 | + 19·1 | 22,165 | 28,494 | 33,732 | + 29·6 | + 28·6 | + 18·4 |
| සැප්තැම්බර් .. | 9,445 | 11,171 | 13,322 | + 16·1 | + 18·3 | + 19·3 | 23,460 | 29,781 | 34,620 | + 32·5 | + 27·0 | + 16·2 |
| ඔක්තෝබර් .. | 9,520 | 11,413 | 13,572 | + 13·4 | + 19·9 | + 18·9 | 23,837 | 30,161 | 35,314 | + 29·7 | + 26·6 | + 17·0 |
| නොවැම්බර් .. | 9,459 | 11,452 | 13,544 | + 5·3 | + 21·1 | + 18·3 | 23,842 | 29,860 | 35,324 | + 24·9 | + 25·3 | + 18·3 |
| දෙසැම්බර් .. | 10,024 | 11,760 | 14,748 | + 6·3 | + 17·4 | + 25·4 | 24,447 | 30,510 | 37,257 | + 23·0 | + 24·9 | + 22·1 |
| මාසික සාමාන්‍ය .. | 9,429 | 11,210 | 13,020 | + 12·7 | + 18·9 | + 16·1 | 22,267 | 28,785 | 33,657 | + 30·7 | + 29·3 | + 16·9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 · 51 සංඛ්‍යා සටහන

### මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩුදුන් සාධක

(ප්‍රමාණය : රුපියල් දශ ලක්ෂ.)

| ශීර්ෂය | 1981 දෙසැම්බර් | 1982 දෙසැම්බර් | 1983 දෙසැම්බර් | 1981/82 වෙනස ප්‍රමාණය | 1981/82 වෙනස ප්‍රතිශතය | 1982/83 වෙනස ප්‍රමාණය | 1982/83 වෙනස ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. .. | 4,822·9 | 5,987·7 | 7,200·1 | + 1,164·8 | + 24·1 | + 1,212·4 | + 20·3 |
| 2. මහජනයා සතු ඉල්ලුම් තැන්පතු .. .. | 5,201·5 | 5,772·1 | 7,547·8 | + 570·6 | + 10·9 | + 1,775·7 | + 30·8 |
| පටු මුදල් සැපයුම ($M_1$) .. | 10,024·4 | 11,759·8 | 14,747·9 | + 1,735·4 | + 17·3 | + 2,988·1 | + 25·4 |
| 3. වෙළෙඳ බැංකු වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු .. .. | 14,422·5 | 18,750·1 | 22,509·0 | + 4,327·6 | + 30·0 | + 3,758·9 | + 20·0 |
| 3·1 සමූපකාර ආයතන .. .. | 334·5 | 357·3 | 469·2 | + 22·8 | + 6·8 | + 111·9 | + 31·3 |
| 3·2 රාජ්‍ය සංස්ථා .. .. | 2,768·4 | 4,257·8 | 4,081·1 | + 1,489·4 | + 53·8 | − 176·7 | − 4·2 |
| 3·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් .. | 11,319·6 | 14,135·0* | 17,958·7* | + 2,815·4 | + 24·8 | + 3,823·7 | + 27·1 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) .. .. | **24,446·8** | **30,509·9** | **37,256·9** | **+ 6,063·0** | **+ 24·8** | **+ 6,747·0** | **+ 22·1** |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය ප්‍රසාරණය (DCE) .. .. | 33,966·6 | 42,397·6 | 49,293·0 | + 8,431·0 | + 24·8 | + 6,895·4 | + 16·3 |
| 1·1 රජයට දෙන ලද ශුද්ධ ණය .. .. | 12,789·1 | 17,150·2 | 17,533·1 | + 4,361·0 | + 34·0 | + 382·9 | + 2·2 |
| 1·1·1 රජයට දෙන ලද දළ ණය .. .. | 15,667·4 | 19,719·8 | 20,972·1 | + 4,052·3 | + 25·8 | + 1,252·3 | + 6·4 |
| මහ බැංකුව විසින් .. .. | 14,104·4 | 18,000·5 | 19,393·0 | + 3,896·0 | + 27·6 | + 1,392·5 | + 7·7 |
| වෙළෙඳ බැංකු විසින් .. .. | 1,563·0 | 1,719·3 | 1,579·1 | + 156·3 | + 9·9 | − 140·2 | − 8·2 |
| 1·1·2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ .. | − 2,878·3 | − 2,569·6 | − 3,439·0 | + 308·7 | + 10·7 | − 869·4 | − 33·8 |
| 1·2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 21,177·4 | 25,247·4 | 31,759·9 | + 4,070·0 | + 19·2 | + 6,512·4 | + 25·8 |
| 1·2·1 සමූපකාර ආයතන .. .. | 1,293·9 | 1,187·7 | 1,822·7 | − 106·2 | − 8·2 | + 634·9 | + 53·5 |
| 1·2·2 රාජ්‍ය සංස්ථා .. .. | 4,487·7 | 4,677·4 | 4,385·2 | + 189·7 | + 4·2 | − 292·3 | − 6·2 |
| 1·2·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් | 15,395·8 | 19,382·3 | 25,552·1 | + 3,986·5 | + 25·8 | + 6,169·8 | + 31·5 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. .. | 2,940·3 | 2,371·8 | 3,186·9 | − 568·5 | − 19·3 | + 815·1 | + 34·4 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. .. | − 12,460·0 | − 14,259·5 | − 15,223·0 | − 1,799·5 | | − 963·5 | |
| 3·1 මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | − 7,615·5 | − 9,382·7 | − 9,417·4 | − 1,767·2 | | − 34·6 | |
| 3·2 වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම්(ශුද්ධ) .. | − 4,702·2 | − 4,891·2 | − 6,319·3 | − 189·0 | | − 1,428·1 | |
| 3·3 හුවමාරු වෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි .. | − 142·3 | 14·4 | 513·7 | + 156·7 | | + 499·3 | |
| මුදල් සැපයුම ($M_2$) .. .. | **24,446·8** | **30,509·9** | **37,256·9** | **+ 6,063·0** | **+ 24·8** | **+ 6,742·0** | **+ 22·1** |


සටහන : සළකුණුවලින් $M_2$ කෙරෙහි ඇති වූ බලපෑම දක්වේ.

* අනේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1982 දී වූ රුපියල් දශ ලක්ෂ 3,896 (සියයට 28) සමග සසඳනවිට වර්ෂය තුළදී මහ බැංකුවෙන් රජයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 1,393 (සියයට 8) කින් පමණක් වැඩි විය. මේ අතර පසුගිය වර්ෂයෙහි වූ රුපියල් දශ ලක්ෂ 156 (සියයට 10) ක වැඩිවීමට ප්‍රතිවිරුද්ධව යමින්, වෙළෙඳ බැංකුවලින් රජයට දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 140 (සියයට 8) කින් පහත වැටුණි. කෙසේ හෝ , 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 309 (සියයට 11) ක අඩුවීම හා සසඳන විට, බැංකු ක්‍රමයෙහි වූ රජයේ තැන්පතු වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 869 (සියයට 34) කින් සැළකිය යුතු ලෙස වර්ධනය වීම මගින්, බැංකු ක්‍රමයෙහි රජයේ දළ ණය ගැනීම් වැඩි වීම තරමක් දුරට සමහන් කෙරුණි.


දේශීය හා විදේශීය අංශයන්හි සතුටුදායක වර්ධනයන් හේතුකොට ගෙන, බැංකු ක්‍රමය මගින් රජයේ ශුද්ධ ණය ගැනීම් සියයට 2 ක වර්ධනයක රඳවා ගත හැකි විය. පළමුවෙන්ම, 1983 මාර්තු මාසයේදී මහ බැංකුවේ ලාභ වලින් රුපියල් දශ ලක්ෂ 1,500 ක් උපයෝගී කර ගැනීම නිසා බැංකු ක්‍රමය මත රජයේ රඳා පැවැත්ම අඩු වූ අතර එය, මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) අඩුවීම මගින් පිළිබිඹු විය. දෙවනුව, රුපියල් ණය වැඩ සටහන සඳහා ඍජු පාලනයට හසුවන මූලාශ්‍රයන්ගේ (Captive Sources) දායකවීම් වැඩිවීම් (ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සේවක අර්පසාධක අරමුදල, නිදන් අරමුදල ආදී) නිසා රජයට බැංකු ක්‍රමය මගින් ගනු ලබන ණය අඩුකර ගත හැකි විය. තෙවනුව, 1983 මුල් කාලයේදී හඳුන්වා දෙන ලද ඉහළ ආනයන බදු හා පිරිවැටුම් බදු සහ තේ සඳහා වටිනාකම අනුව අයකරන බදු (Ad-valorem tax) වැඩි කිරීම මගින් රජයට ආදායම් වැඩි කර ගැනීමට හැකි විය. එසේම, ප්‍රාග්ධන වියදමෙහි අඩුවීමක් හා ජපාන යෙන් ණය මුදල් සහ යුරෝ ව්‍යවහාර ණය මුදලින් (Euro Currency Loan) කොටසක් උපයෝගී කර ගැනීම හේතුකොටගෙන, රජයට බැංකු ක්‍රමය මගින් ණය ගැනීම් අවම කරගැනීමට හැකි විය.

පසුගිය වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 4,070 ක හෙවත් සියයට 19 ක වැඩිවීමක් හා සසඳන විට විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය (රාජ්‍ය සංස්ථා, සමුපකාර ආයතන හා අනෙකුත් පෞද්ගලික අංශයෙන් සමන්විත වන) රුපියල් දශ ලක්ෂ 6,512 කින් හෙවත් සියයට 26 කින් තියුණු ලෙස වැඩි විය. පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි මුළු වැඩිවීමෙන් විශාල ප්‍රමාණයක් (සියයට 95 ) අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන්ට දෙන ලද ණයෙහි වැඩිවීමක් හේතුකොට ගෙන විය. පසුගිය වර්ෂයේ වූ සියයට 26 හා සසඳන විට මේ අංශයට දෙන ලද දළ ණය 1983 දී සියයට 32 කින් වැඩි විය. 1982 පසු භාගයේදී වූ මැතිවරණ කටයුතු මගින් ඇතිවූ දේශපාලන ස්ථාවරත්වය නිසා වැඩිවූ ආර්ථික ක්‍රියාවලින් 1983 පළමු කාර්තුවේදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි වර්ධනයට හේතු වන්නට ඇත. වසරේ මැද භාගයේදී කෙටි කාලීන පොළී අනුපාතික අඩු කිරීම හේතුකොටගෙන ණය සඳහා වූ ඉල්ලුමෙහි වැඩිවීම, ජූලි මස ඇති වූ කලබලවල බලපෑම හේතුකොටගෙන තවදුරටත් වේගවත් විය. ජූලි මාසයේදී ඇතිවූ කලබලකාරී තත්ත්වය හේතුකොටගෙන පෞද්ගලික අංශය හා සම්බන්ධ සමහර ව්‍යාපාර මගින් ණය සහ අත්තිකාරම් (දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 800) ආපසු ගෙවීම ප්‍රමාද වීම සහ අනුමත කරන ලද අයිරාවන් සම්පූර්ණයෙන්ම භාවිතයට ගැනීම ආපසු නොගෙවා පැවති ණය ඉහළ මට්ටමක රඳවා ගැනීමට හේතු විය. මෙතෙක් කල් පිටකොටුවේ සංවිධානය නොවූ වෙළෙඳපොල (Pettah Kerb Market) මගින් මූල්‍යකරණය කරන ලද සේවා අංශයෙහි ණය අවශ්‍යතාවයන් සපුරාලීමට බැංකු ඉදිරිපත්වීම ද ණය හා අත්තිකාරම් ඉහළ නැගීමට හේතු විය.

1983 දී ආර්ථිකයෙහි මිළ මට්ටම්හිද සැළකිය යුතු පීඩනයක් දක්නට ලැබුණි. ලක්ෂ්‍යාමය පදනමක් අනුව ගත් කල, 1982 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ දොළොස් මස තුළ, සියයට 5 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ, කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය 1983 දී, සියයට 21 කින් ඉහළ නැගුණි. මේ අතර 1982 දී සියයට 11 ක් වූ මෙම මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය වැඩිවීම 1983 දී සියයට 14 ක් විය.

## බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

1982 දී රුපියල් දශ ලක්ෂ 106 (සියයට 8) ක අඩුවීමක් හා සසඳන විට 1983 දී රුපියල් දශ ලක්ෂ 635 (සියයට 54) ක වර්ධනයක් දක්වූ සමූපකාර ආයතන මගින් ද ණය, සඳහා වූ ඉහළ ඉල්ලුම කවදුරටත් පැහැදිලි විය. අවුරුද්දේ පළමු මාස හතර තුළදී රුපියල් දශ ලක්ෂ 1,001 (සියයට 84) කින් ක්‍රමානුකූලව වර්ධනය වූ, සමූපකාර ආයතන වලට දෙන ලද දළ ණය වර්ෂයේ ඊලඟ මාසවලදී ආන්තික අඩුවීම් වාර්තා කළේය. රුපියල් දශ ලක්ෂ 526 (සියයට 37) කින් ඉහළම මාසික වර්ධනයක් ඇති වූයේ මාර්තු මාසයෙහිදීය. 1982/83 මහ කන්නයේ වූ ඉතා විශාල වී අස්වැන්න හේතුකොටගෙන සහතික මිළ ක්‍රමය යටතේ වී මිළදී ගැනීම් වැඩි වූ අතර, ඒ නිසා වී මිළදී ගැනීම් සඳහා අත්තිකාරම් තියුණු ලෙස වර්ධනයවීම හා 1983 මාර්තු මාසයේ සිට සහතික මිළ ක්‍රමය යටතේ වී බුසලක මිළ රුපියල් 57.50 සිට රුපියල් 62.50 දක්වා ඉහළ නැංවීම මගින් වර්ෂයේ පළමු මාස හතර තුළදී ණය දීමෙහි වූ මෙම සැළකිය යුතු වර්ධනය පිළිබිඹු විය. මෙම වර්ධනයන්, සමූපකාර ආයතන වෙනුවෙන් බැංකු මගින් ණය මුල්‍යාකරණය කිරීම ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. සමූපකාර ආයතන සඳහා දෙන ලද ණය වලින් විශාල ප්‍රමාණයක් විශේෂයෙන් ම වී අලෙවි මණ්ඩලයේ වී මිළදී ගැනීම් සඳහා දුන් ණය වේ.

මේ අතර, 1982 දී වූ රුපියල් දශ ලක්ෂ 190 ක හෙවත් සියයට 4 ක වැඩිවීමක් හා සසඳන විට සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී, රාජ්‍ය සංස්ථා සඳහා දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 292 (සියයට 6) කින් පහත වැටුණි. මේ අංශය සඳහා දෙන ලද ණය වර්ෂය තුළදී අක්‍රමවත්ව වෙනස් වූ අතර, ඉහළම මාසික වර්ධනයන් (සියයට 7) පෙන්නුම් කරන ලද්දේ මාර්තු, අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවලදීය. මේ අංශය සඳහා ණය දීම අඩුවීම ප්‍රධාන වශයෙන්ම ණය (රුපියල් දශ ලක්ෂ 443) සහ ආනයන බිල්පත් (රුපියල් දශ ලක්ෂ 289) සම්බන්ධයෙන් විය. සමහර සංස්ථාවන්හි සාර්ථක මූල්‍ය කළමනාකරණය, විකුණුම්වලින් ලත් ලාභ නිසා මුදල් ශේෂවල සැළකිය යුතු වැඩිවීම සහ ඉහළ පොලී අනුපාත හේතුකොට-ගෙන සමහර සංස්ථාවන් බැංකු මගින් ණය ගැනීම් අඩු කිරීමට තීරණය කිරීම, රාජ්‍ය සංස්ථා බැංකු මගින් ණය ගැනීම් අඩුවීමට තරමක් දුරට හේතු විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා නැව් සංස්ථාව විදේශීය මූල්‍යකරණ දිගටම පවත්වාගෙන යාමද, දේශීය බැංකු මගින් රාජ්‍ය සංස්ථාවල ණය ගැනීම් අඩුවීමට හේතු විය. කෙසේ හෝ ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය, වැවිලි සංස්ථාවන් දෙක සහ ශ්‍රී ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙහි ණය ගැනීම් වර්ෂය තුළ ඉහළ මට්ටමක පැවතුණි.

1982 දී රුපියල් දශ ලක්ෂ 569 ක හෙවත් සියයට 19 ක අඩුවීම හා සසඳන විට 1983 දී බැංකු ක්‍රමයෙහි විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 815 කින් හෙවත් සියයට 34 කින් වැඩි විය. බැංකු විදේශීය වත්කම්හි වැඩිවීම රටෙහි ගෙවුම් ශේෂ තත්ත්වය යහපත් වීමේ ප්‍රතිඵල-යකි. කෙසේ හෝ බැංකු විදේශීය වත්කම් වසර තුළ අක්‍රමවත් ලෙස හැසිරීමක් පෙන්නුම් කළේය. මෙයින් ඉහළම මාසික වර්ධනයක් පෙන්නුම් කරන ලද්දේ 1983 නොවැම්බර් මාසයෙහිදීය. මෙය, ප්‍රධාන වශයෙන්ම මහ බැංකුවේ විදේශීය මුදල් හා ශේෂ දැරීම ඉහළ නංවන ලද අපනයන ඉපයුම් වැඩිවීම නිසා වෙළෙඳ බැංකුවලින් විදේශීය විනිමය මිළදී ගැනීම (රුපියල් දශ ලක්ෂ 3,948), ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ගිවිසුම යටතේ හැර ගැනීම (රුපියල් දශ ලක්ෂ 517), ජපානයෙන් ණය මුදල් (රුපියල් දශ ලක්ෂ 331) භාවිතා කිරීම හා යූරෝ ව්‍යවහාර ණය මුදලෙන් කොටසක් (රුපියල් දශ ලක්ෂ 625 ක් ) ලැබීම හේතු කොටගෙන සිදුවූවකි.

### වෙළෙඳ බැංකු කටයුතු

1983 වර්ෂයේ වෙළෙඳ බැංකු කටයුතු පිළිබඳ විශේෂ ලක්ෂණයක් වූයේ කලින් කලට ඇතිවූ ද්‍රවශීලතා ප්‍රශ්නයන්ය. බැංකු විසින් මුහුණපෑ ද්‍රවශීලතා දුෂ්කරතා වර්ෂයේ දෙවැනි භාගය වන විට වඩා උග්‍ර තත්ත්වයකට පත් විය. මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1983 ජූලි මාසයේ සිට අනෙකුත් පෞද්ගලික අංශයෙහි ණය ඉල්ලුමේ ඇතිවූ වැඩි වීමයි.

වර්ෂයේ ප්‍රථම මාස හය තුළ සියයට 13 කින් වර්ධනයවූ අනෙකුත් පෞද්ගලික අංශයට දුන් ණය ජූලි මාසය තුළ සියයට තුනකින් වැඩිවූයේ ඉහළ නැගීමේ උපනතියක් දක්වමිනි. අගෝස්තු මාසය තුළ මෙම අංශයට දුන් ණය සියයට 6 කින් වැඩි වූ අතර, එය 1983 වර්ෂයේ එක් මාසයක් තුළදී ඇතිවූ ඉහළම වර්ධනය විය. ණයෙහි ඇතිවූ තියුණු වර්ධනය මගින් එක්තරා දුරකට පිළිබිඹුවූයේ වර්ෂයේ ප්‍රථම භාගය තුළ සිදුකරන ලද පොලී අනුපාතික පහත දැමීමේ ප්‍රතිපත්ති සංශෝධනයේ බලපෑමයි. වෙළෙඳ බැංකු ආරංචි මාර්ග අනුව ජූලි මාසයේ ඇතිවූ කලබල නිසා ණය ආපසු ගෙවීම් අඩුවීමද ඉහළ ණය මට්ටමක පැවතීමට හේතු විය. අළුතින් ණය මුදල් සැපයීමෙන්, දී තිබූ ණය සම්බන්ධ කාලසීමා දීර්ඝ කිරීමෙන් මෙන්ම එම ණය සඳහා වූ පොලී පහත හෙලීමෙන්ද බැංකු, පීඩාවට පත් සිය ගණුදෙනුකරුවන්ට අනුග්‍රහ දැක්වූහ. මිනුම් ගණනක් මගින්ම පිළිබිඹු වන පරිදි වර්ෂයේ හතරවැනි කාර්තුවේදී ද්‍රවශීලතා ප්‍රශ්න වඩා උග්‍ර තත්ත්වයකට පත් විය. විශේෂයෙන්ම, පටු තැන්පතු පදනමකින් යුතු වූ විදේශීය බැංකු විසින් අරමුදල් ඉල්ලුම වැඩි කිරීම නිසා අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි පොලී අනුපාතික ඉහළ මට්ටමකට නැගුණි. 1982 අවසානයේ සියයට 15.75–18.50 දක්වා වූ පරතරයක පැවති මෙම පොලී අනුපාතික, 1983 ඔක්තෝබර් අවසානය වන විට සියයට 18.5 – 35 දක්වා පරතරයකටද, දෙසැම්බර් අවසානය වන විට සියයට 20 – 37 දක්වා වූ පරතරයකටද ඉහළ නැගුණි. සිය තාවකාලික ද්‍රවශීලතා ප්‍රශ්න සඳහා පිළියම් වශයෙන් වෙළෙඳ බැංකු විසින් දණ්ඩන පොලී අනුපාතික යටතේ මහ බැංකුවෙන් ද ණය ලබා ගන්නා ලදී.

වැඩිවන ණය ඉල්ලුම පිළිබිඹු කරමින්, ණය/තැන්පතු අනුපාතිකය වර්ෂය මුල සිටම ඉහළ යාමේ උපනතියක් දැක්වීය. වර්ෂයේ මුල් දස මාසය තුළ මෙම අනුපාතය 0.92 සිට 0.99 දක්වා ක්‍රමයෙන් ඉහළ නැගුණි. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද සීමාකාරී මූල්‍ය ප්‍රතිපත්තීන් තරමක් දුරකට බලපැවැත්වීමෙන්, ණය තැන්පතු අනුපාතිකය 0.98 හා 0.93 දක්වා වර්ෂයේ අවසාන මාස දෙක තුළ අඩු විය.

1983 දී බැංකු තවදුරටත් තැන්පතු රැස්කිරීමේ යෙදී සිටි අතර මෙහිදී විශේෂ අවධානයක් යොමු කරන ලද්දේ කෙටි කාලීන, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු කෙරේය. වෙළෙඳ බැංකු විසින් කෙටිකාලීන තැන්පතු හා ඉතිරි කිරීම් තැන්පතු රැස්කිරීම කෙරේ දැක්වූ වැඩි කැමැත්ත මගින් පිළිබිඹු වූයේ පොලී අනුපාතිකයන්හි අනාගත චලනයන් පිළිබඳව මූල්‍ය අංශයන්හි පැවති අවිනිශ්චිත තත්ත්වයයි. බැංකු විසින් තැන්පතු සහතික නිකුත් කිරීම තවදුරටත් කරගෙන ගියේ සහවන ලද මුදල් සැහෙන ප්‍රමාණයක් බැංකු අංශය වෙත ඇදගනිමිනි. 1983 අවසානයේ බැංකු 20 කට තැන්පතු සහතික නිකුත් කිරීම සඳහා අනුමැතිය දී තිබූ අතර, එදිනට නිකුත් කර නොපියවා පැවති තැන්පතු සහතික ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 610 ක් විය. බැංකු විසින් විදේශීය අණකර මුදල් කිරීම සඳහා සැළසූ පහසුකම් වර්ෂය තුළදී තවදුරටත් පුළුල් කරන ලදී. මෙම අණකර සෙනසුරාදා දිනයන්හි මුදල් කිරීම සඳහා ලංකා බැංකුව විසින් විශේෂ සේවයක් අරඹන ලදී. මේ අතර බැන්ක් ඔෆ් ක්‍රෙඩිට් ඇන්ඩ් කොමර්ස් ඉන්ටර් නැෂනල් (ඕවර්සීස්) ලිමිටඩ් (Bank of Credit and Commerce International (Overseas) Ltd.) විසින් කටුනායක ගුවන් තොටුපලේ විදේශීය ව්‍යවහාර මුදල්, රුපියල් කිරීමේ හා හුවමාරු කිරීමේ කවුළුවක් විවෘත කරන ලදී.

වඩා දියුණු හා සංකීර්ණ බැංකු සහ මූල්‍ය සේවා සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම සඳහා බැංකු කටයුතු පුළුල් කිරීමේ අවශ්‍යතාවය වටහා ගනිමින්, විදේශීය හවුලක් සහිත ප්‍රථම වණික් බැංකුව 1983 දී කටයුතු ආරම්භ කරන ලදී. මෙය මහජන බැංකුව හා ලන්ඩනයේ ගිනස් මැහොන් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් (Guinness Mahon and Co., Ltd.) හවුල් වීමෙන් පිහිටුවන ලද්දකි. ද පීපල්ස්මර්චන්ට් බැන්ක් (The People's Merchant Bank) එහි කටයුතු ඇරඹූ මුල් වසරේ ව්‍යාපෘති හඳුනා ගැනීම, ව්‍යාපෘති වර්ධනය හා ණය සමූහකරණයෙහි නිරත විය.

වර්ෂය තුළ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි කටයුතුද වර්ධනය විය. 1983 අවසානයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගණන 24 කි. මෙම ඒකකයන්හි මුළු වත්කම්/වගකීම් රුපියල් දශ ලක්ෂ 13,828 (ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 649) සිට රුපියල් දශ ලක්ෂ 20,457 (ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 818) දක්වා වර්ෂය තුළදී වැඩි විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි කටයුතු අතර ප්‍රධාන තැනක් ගන්නේ නිදහස් වෙළෙඳ කලාපයෙහි ව්‍යාපෘති මූල්‍යකරණය, අනුමැතිය ලද නේවාසිකයන්ට යුරෝ-ව්‍යවහාර මුදල් ණය සැපයීම හා සිය ගණුදෙනුකරුවන් වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදල් ඇපකර සැපයීමය.

1983 වර්ෂයේ වෙළෙඳ බැංකු සම්පත් රුපියල් දශ ලක්ෂ 10,188 කින් වැඩි වූ අතර, 1982 වර්ෂයේ සම්පත් වර්ධනය රුපියල් දශ ලක්ෂ 7,438 ක් විය. කලින් වසරේ දක්නට වූ උපනතියට අනුව යමින් 1983 වර්ෂයේ සම්පත් වර්ධනයෙන් සැළකිය යුතු කොටසක් එනම් රුපියල් දශ ලක්ෂ 6,373 ක් සෑම වර්ගයේම තැන්පතු වැඩිවීම මගින් පිළිබිඹු විය. මෙම වර්ධනය කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු (රාජ්‍ය බැංකු දෙකේ දිගු කාලීන තැන්පතුද ඇතුළුව) හා ඉල්ලුම් තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 4,576 කින් හා රුපියල් දශ ලක්ෂ 1,797 කින් වැඩිවීමෙන් සමන්විත විය. 1983 දී වෙළෙඳ බැංකුවල ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,624 කින් වැඩි විය. මෙය අන්තර් බැංකු ණය (මහ බැංකුවද ඇතුළුව) රුපියල් දශ ලක්ෂ 1,121 කින් හා විදේශීය ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 503 කින් සමන්විත විය. වර්ෂය තුළදී වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ලබා ගත් ණය රුපියල් දශ ලක්ෂ 1,462 කින් වැඩි වූයේ ප්‍රධාන වශයෙන් විවිධ ප්‍රතිමූල්‍ය ක්‍රමයන් යටතේ දුන් පහසුකම්වල වර්ධනයක් පිළිබිඹු කරමිනි.

**1 . 52 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ බැංකු සම්පත් සහ ඒවා උපයෝගීකරණයේ වෙනස් වීම්**

රුපියල් දශ ලක්ෂ

| අංශය | 1981 අග/ 1982 අග | 1982 අග/ 1983 අග |
|---|---|---|
| 1· රජය .. .. | — 51·4 | 278·0 |
| 2· මහ බැංකුව .. .. | — 315·0 | — 41·6 |
| 3· රාජ්‍ය සංස්ථා .. .. | 1,416·7 | 532·3 |
| 4· සමූපකාර ආයතන .. .. | 127·9 | — 527·5 |
| 5· අනෙකුත් පෞද්ගලික .. .. | — 719·7 | —1,018·3 |
| 6· අන්තර් බැංකු .. .. | — 108·9 | 1,243·8 |
| 7· විදේශීය .. .. | — 349·6 | — 466·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: අඩු කිරීමේ සළකුණින් ශුද්ධ වශයෙන් සම්පත් උපයෝගීකරණයක් දැක්වේ.

වෙළෙඳ බැංකු සම්පත්වල වෙනස්කම් හා ඒවායේ උපයෝගීකරණය ශුද්ධ පදනමක් මත 1.52 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. 1983 වර්ෂය තුළ අනෙකුත් පෞද්ගලික අංශය වෙළෙඳ බැංකු සම්පත් වලින් රුපියල් දශ ලක්ෂ 1,018 ක් භාවිතා කරමින් වැඩි වශයෙන්ම සම්පත් භාවිතා කළ අංශය බවට පත් විය. සමූපකාර ආයතනයන්හි වෙළෙඳ බැංකු සම්පත් පරිහරණය රුපියල් දශ ලක්ෂ 528 ක් වූ ඉහළ මට්ටමක පැවති අතර මින් වැඩි වශයෙන් පිළිබිඹු වූයේ වී අලෙවි මණ්ඩලයට වී මිළදී ගැනීම සඳහා දෙන ලද භාණ්ඩ කුවිතාන්සි අත්තිකාරම්ය. පසුගිය වර්ෂ දෙකේ දක්නට වූ උපනතියට වෙනස්ව යමින් රාජ්‍ය අංශය විසින් වෙළෙඳ බැංකු සම්පත් වැඩි වීමට ශුද්ධ වශයෙන් රුපියල් දශ ලක්ෂ 278 කින් දයක විය. මේ අතර, මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු සම්පත් වලින් රුපියල් දශ ලක්ෂ 42 ක ශුද්ධ ප්‍රමාණයක් ලබා ගන්නා ලද්දේ ප්‍රධාන වශයෙන් වැඩි වූ සංචිත අවශ්‍යතා නිසාය. විදේශීය අංශයේ

ගණුදෙනු සඳහා වෙළෙඳ බැංකු සම්පත් වලින් රුපියල් දශ ලක්ෂ 467 ක් වැය වූ අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අපනයන බිල්පත් ඇතුළුව විදේශීය ශේෂයන්හි ඇති වූ වැඩි වීමකි.

**බැංකු ශාඛා ව්‍යාප්තිය**

1983 වසර තුළදී වෙළෙඳ බැංකු විසින් නව ශාඛා 16 ක් විවෘත කරන ලදී. මෙම නව බැංකු ශාඛා, ලංකා බැංකුව විසින් විවෘත කළ ශාඛා 11 කින්ද, මහජන බැංකු ශාඛා 3 කින්ද, ලංකා වාණිජ බැංකුව සහ හැටන් නැෂනල් බැංකුව මගින් එක් ශාඛාවක් බැගින්ද විවෘත කළ ශාඛා බැංකුවලින් සමන්විත විය. මෙම බැංකු ශාඛා විවෘත කිරීමත් සමග වසර අවසාන වනවිට මුළු බැංකු ශාඛා ප්‍රමාණය (කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා, ගෙවීම් කාර්යාල, ව්‍යාප්ති කාර්යාල, කච්චේරි ශාඛා සහ විදේශීය ශාඛා ඇතුළුව) 1,034 ක් විය. ඉකුත් වසරේදී මෙන්ම ලංකා බැංකුව විසින් ආරක්ෂක හා ආර්ථික හේතූන් මත සිය කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා 7 ක් ප්‍රතිස්ථානගත කළ හෙයින් 1983 වර්ෂය අවසාන වනවිට ප්‍රතිස්ථානගත කරන ලද මුළු ශාඛා ගණන 311 ක් විය. වසර අවසන් වනවිට වෙළෙඳ බැංකු ප්‍රධාන ශාඛා ගණන 600 ක්වූ අතර, ක්‍රියාත්මක වෙමින් පවතින කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා ප්‍රමාණය 79 ක් විය.

වසර තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නව ශාඛා 3 ක් විවෘත කලෙන්, වසර අවසාන වනවිට එහි මුළු ශාඛා ගණන 50 ක් විය. 1982 දී අනුමත කරන ලද නිව්යෝක්හි බැන්කර්ස් ට්‍රස්ට් සමාගමෙහි නියෝජිත කාර්යාලය 1983 දී ව්‍යාපාරික කටයුතු සඳහා ආරම්භ කරන ලදී. මෙය විදේශීය බැංකු විසින් ශ්‍රී ලංකාවේ විවෘත කරන ලද දෙවන නියෝජිත කාර්යාලයයි.

**පොලී අනුපාතික**


1981 අගෝස්තු මාසයේදී කරන ලද තුන්වන පොලී අනුපාතික සංශෝධනය 1982 වර්ෂය තුළදී පවත්වාගෙන යන ලද අතර, 1983 දී එයට ඇතැම් සුළු සංශෝධන ඇති කරන ලදී. 1980/81 වර්ෂයන්හි පැවති අධික මිළ වැඩිවීම් සමග සැසඳීමේදී මූල්‍ය සමස්ථයන්හි හා මිළ මට්ටම්හි වෙනස්වීම්වල තරමක ස්ථාවරත්වයක් 1982 හි හා 1983 වර්ෂයේ මුල් කාලයේදී දක්නට ලැබුණි. මෙකී වර්ධනයන්, මහ බැංකුවට එහි පොලී අනුපාතික ප්‍රතිපත්තිය ගැන නැවත සිතා බැලීමට හා විශේෂ අවශ්‍යතාවයන් අවධානයට ගනිමින් අවශ්‍ය ස්ථානයන්හි එය වෙනස් කිරීමට අවකාශයක් ඇති කරන ලදී. අපනයනයට නැඹුරු වර්ධනය සැලකීමේදී අපනයන අංශය සඳහා සහනදායී ණය මුදල් ලබා දීම අවශ්‍ය විය. ඉල්ලුම් පාලන ප්‍රතිපත්තීන් සඳහා යොදා ගත් අධි පොලී අනුපාතික ප්‍රතිපත්තිය ණය පිරිවැය අධික කිරීමෙන් ප්‍රමුඛතා අංශයන්ගේ කාරක ප්‍රාග්ධන සම්පාදනයෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී. එම නිසා සැපයුම් වැඩි කිරීමේ අරමුණින් ප්‍රමුඛතා අංශයන් සඳහා අඩු පොලියට ණය ලබා දීමට හැකි වන අයුරින් සමහර පොලී අනුපාතිකයන්හි වෙනස්කම් ඇති කරන ලදී.

මෙම ප්‍රතිපත්ති මාලාවේ කොටසක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව කෙටි කාලීන පොලී අනුපාතිකයන් අඩු කිරීම ආරම්භ කරන ලදී. 1983 මාර්තු මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව විසින් වර්ෂයකට සියයට 14 ක් වූ මහ බැංකු පොලී අනුපාතිකය 13 දක්වා අඩු කරන ලදී. 1983 මාර්තු 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි දණ්ඩන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 21-30 පරතරයේ සිට සියයට 20 ක් වූ ඒකීය අනුපාතිකයකට අඩු කරන ලදී.

වෙළෙඳ බැංකු, මහ බැංකුවෙන් ණය ගැනීමේදී පොලිය අඩු කිරීමත් එමගින් එම ආයතන වලට ප්‍රමුඛතා අංශයන් සඳහා අඩු පොලියට ණය ලබා දීමට හැකියාව ඇති කිරීම මෙම ප්‍රතිපත්තීන් මගින් බලාපොරොත්තු විය.

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

මෙයට අමතරව ප්‍රමුඛතා අංශයන් වෙත විශේෂයෙන් අපනයන අංශයට, ණය පහසුකම් ලබා දීම වැඩි කිරීමට බලපාන වෙනස්කම් කිහිපයක්ද ඇති කරන ලදී. මේ අනුව මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වෙත සපයන පූර්ව අපනයන ප්‍රතිමූල්‍ය ණය සඳහා පැවති වාර්ෂික පොලී අනුපාතිකය සියයට 12 සිට 11 දක්වා මාර්තු මාසයේදී අඩු කරන ලද අතර, එය තවදුරටත් සියයට 10 දක්වා 1983 ජූනි මාසයේ අඩු කරන ලදී. පොලී අනුපාතිකයන් පහත හෙළීමත් සමග මෙකී ණය සඳහා වෙළෙඳ බැංකු විසින් අය කරන ආන්තික පොලී පරතරය සියයට 4 සිට 3 දක්වා අඩු කරන ලදී. 1983 මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි සම්ප්‍රදායික නොවන අපනයන සඳහා වූ අනුපූරක ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සඳහා පැවති පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 8.5 සිට 7 දක්වා අඩු කරනු ලැබීය. 1983 අප්‍රේල් මාසයේදී මැදි හා දිගු කාලීන ණය අරමුදලින් දෙනු ලබන සියළුම ණය වර්ගයන් සඳහා බලපාන පොලී අනුපාතිකයන් සියයට 1 කින් අඩු කරන ලද අතර, III හා IV වැනි කාණ්ඩයන් යටතේ ණය දීමේදී ණය ආයතනවලට අය කර ගත හැකි ආන්තිකයන් සියයට 5 සිට 4 දක්වා අඩු කරන ලදී.

මූල්‍ය තැන්පතු සඳහා වෙළෙඳ බැංකුවල ප්‍රධාන තරඟකරුවා වූ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා කල් පිරීමේදී ගෙවනු ලබන පොලී අනුපාතික වර්ෂයකට සියයට 20 සිට 18 දක්වාද, (මාසිකව ගෙවනු ලබන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 18.6 සිට 16.8 දක්වාද) මාස 6 ස්ථාවර තැන්පතු සඳහා පොලිය වර්ෂයකට සියයට 15 සිට 14 දක්වාද 1983 අප්‍රේල් මාසයේදී අඩු කරන ලදී. මාස 24 ක් සඳහා ස්ථාවර තැන්පතු පිළිගැනීමද ජාතික ඉතිරි කිරීමේ බැංකුව නවතා දමන ලදී.

සාමාන්‍ය පොලී අනුපාතික ව්‍යුහයේ අඩු කිරීම අනුගමනය කරමින් සමහර දිගුකාලීන ණය දෙන ආයතනයන්ද ඒවායේ පොලී අනුපාතිකයන් 1983 ජූනි මාසයේදී අඩු කරන්නට යෙදුනි. ලංකා සංවර්ධන මූල්‍යසමායතනය ණය ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ සහනදායී මූල්‍ය පහසුකම් සඳහා සුදුසුකම් නොලබන ව්‍යාපෘතීන් හැර අන් සියළු කාර්මික ව්‍යාපෘති ණය සඳහා පැවති පොලී අනුපාතිකයන් වර්ෂයකට සියයට 17 සිට 14 දක්වා අඩු කරන ලදී. මෙම නව පොලී අනුපාතික 1983 ජූනි මාසයේ සිට බලපැවැත්විය. මේ අතර ජාතික සංවර්ධන බැංකුව සෘජු ණය සඳහා එහි පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 17 සිට 14 දක්වා අඩු කරන ලද අතර, කුඩා හා මධ්‍යම ප්‍රමාණ කාර්මික ව්‍යාපෘතීන් සඳහා වූ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 20 සිට 14 දක්වා 1983 ජූනි මාසයේදී අඩු කරන ලදී.

1983 වර්ෂයේ දෙවන භාගයේදී පොලී අනුපාතික ව්‍යුහයේ සිදුවූ වෙනස්කම් කෙරෙහි එම වර්ෂයේ පළමු භාගයේ හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ක්‍රියාවන් ප්‍රධාන වශයෙන් බලපාන ලදී. වර්ෂයේ මුල් භාගයේ පොලී අනුපාතික ව්‍යුහයේ සිදුකල අඩු කිරීම් අනුගමනය කරමින් 1983 ජූලි මාසයේදී රාජ්‍ය බැංකු දෙක ඒවායේ ණය අත්තිකාරම් සඳහා වූ පොලී අනුපාතිකයන් සියයට 1 සිට 4 දක්වා ප්‍රමාණයන්ගෙන් අඩු කරනු ලැබීය. මෙයට අමතරව ලංකා බැංකුව විසින් වාර්ෂික ස්ථාවර තැන්පතු සඳහා කල් පිරීමේදී ගෙවනු ලැබූ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 18 සිට 16 දක්වාද මාසිකව ගෙවනු ලැබූ පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 16.8 සිට 14.5 දක්වාද අඩු කරන ලදී. මෙම සංශෝධනයන් සමගම මෙම බැංකුව මගින් මාසිකව පොලී ගෙවන 6 මාසික ස්ථාවර තැන්පතු ක්‍රමයක් වර්ෂයකට සියයට 12.5 පොලී අනුපාතිකයන් සහිතව පළමු වරට හඳුන්වා දෙනු ලැබීය.

ප්‍රධාන වශයෙන් ණය අරමුදල් සඳහා වූ පිරිවැය අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ණය සඳහා වූ ඉල්ලුම සහ එම නිසා පුද්ගලික අංශයේ නොපිය වූ ණය ප්‍රමාණයද වර්ෂය අවසානයේදී සැළකිය යුතු ඉහළ මට්ටමකට වැඩි විය. 1983 අවසාන මාස දෙක තුලදී මහ බැංකුව විසින් පනවන ලද මූල්‍ය ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙන්. ඇතැම් වෙළෙඳ බැංකුවල සහ ඒක්ෂණ මුදල් වෙළෙඳපොලෙහි තැන්පතු සහ ණය පොලී අනුපාතිකයන් 1983 අග භාගයේදී ඉහළයාම හේතුකොටගෙන අධික ණය ඉල්ලුම පිළිබිඹු කරමින් පවත්නා පොලී අනුපාතික ව්‍යුහය මත පීඩනයක් ඇති කලේය.

වෙළෙඳ බැංකු විසින් කෙටි කාලීන අරමුදල් සඳහා පැවති අඩු ඉල්ලුම පෙන්නුම් කරමින් ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙහි 1982 දෙසැම්බර් මස පැවති පොලී අනුපාතිකයන් වර්ෂයකට සියයට 15.75 – 18.5 ක පරතරයේ සිට 1983 ජූනි වනවිට වර්ෂයකට සියයට 11.5 – 15.0 ක පරතරයක් දක්වා අඩු විය. 1983 වර්ෂයේ දෙවන භාගයේ පැවති අධික ණය ඉල්ලුම විසින් වෙළෙඳ බැංකුවල ද්‍රවශීලතාවය අඩු කල අතර, එමගින් ඒක්ෂණ මුදල් වෙළෙඳ පොලේ පොලී අනුපාතිකයන් වර්ෂයකට සියයට 20–37 ඉහළ පරතරයකට වැඩි විය.

1983 මැයි මාසයේදී භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළෙඳපොලෙහි පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 13.5 සිට 12.0 දක්වා අඩු කරනු ලැබීය. මේ අතර ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොලෙහි වාර්ෂික වට්ටම් අනුපාතිකය (මහ බැංකු විකුණුම් අනුපාතිකය) 1982 දෙසැම්බර් මාසයේ වූ සියයට 12.25 සිට 1983 ජූනි මාසයේදී වර්ෂයකට සියයට 12.0 දක්වා අඩු විය. 1982 දෙසැම්බර් මාසයේදී සියයට 13.25 ක් වූ වාර්ෂික ප්‍රතිවට්ටම් අනුපාතිකය (මහ බැංකු මිළදී ගැනුම් අනුපාතිකය) 1983 මාර්තු මාසයේදී සියයට 13.75 දක්වා වැඩිවූ අතර, ඉන් අනතුරුව ක්‍රමයෙන් අඩුවී 1983 අවසානයේදී සියයට 12.50 විය.

රජයේ සුරකුම්පත් සඳහා වූ පොලී අනුපාතිකයද 1983 ජූලි මාසයේදී සියයට 16 සිට 14 දක්වා අඩු කල අතර, ඒ සමගම කල් පිරෙන කාලය අවුරුදු 3 සිට 5 දක්වා දීර්ඝ කරන ලදී.

**මහ බැංකු කටයුතු**

1983 දෙසැම්බර් අග වනවිට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 33,097 ක් විය. එය පසුගිය වර්ෂයට වඩා සියයට දහයක වැඩි වීමක් පෙන්නුම් කළේය. වත්කම් අංශය සළකා බලන කල, දේශීය වත්කම් අංශයේ සියළුම වත්කම් සැළකිය යුතු වැඩිවීම් පෙන්නුම් කළ අතර, විදේශීය වත්කම් සුළු වශයෙන් වැඩි විය.

දේශීය වත්කම්හි වැඩි වීම වූ රුපියල් දශ ලක්ෂ 2,941 කට ප්‍රධාන හේතුව වූයේ වෙළෙඳ බැංකු වෙත අනුමත කරනු ලැබූ කෙටිකාලීන ණයයි (රුපියල් දශ ලක්ෂ 1,528). මෙය, 1983 වර්ෂයේ ප්‍රථම භාගය තුළදී මහ බැංකුව මගින් වැඩි කරනු ලැබූ අපනයන ප්‍රතිමූල්‍ය පහසු-කම් උපයෝගීකර ගැනීමේ වැඩිවීම් සහ අලෙවිය සඳහා දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් දිගටම පවත්වා ගැනීමද පිළිබිඹු කළේය. මීට අමතරව, රජය හා රජය සහතික කල සුරකුම්පත් දැරීම ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් (රුපියල් දශ ලක්ෂ 738), රජයට දුන් ණය හා අත්තිකාරම් (රුපියල් දශ ලක්ෂ 654) හා වාණිජ බැංකු හා වෙනත් ආයතන වෙත දෙනු ලබන දිගු කාලීන හා මධ්‍ය කාලීන ප්‍රතිමූල්‍ය ණයෙහි පසුගිය වර්ෂය ඉක්මවා පැහැදිලි වැඩිවීම් පෙන්නුම් කළේය. කෙසේ නමුත්, ශුද්ධ රාජ්‍ය ණය (ශු. රා. ණ.) සුළු ප්‍රමාණයකින් වැඩි වීමට හේතු වූයේ වර්ෂයේ අවසාන මාසවලදී රජයේ තැන්පතුවල ඇති වූ සැලෙන වැඩි වීමය.

ඉහළ ගිය විදේශීය සුරකුම්පත් ආයෝජනය (රුපියල් දශ ලක්ෂ 494) සහ පහත වැටුනු විශේෂ හැර ගැණුම් දැරීම්වල (රුපියල් දශ ලක්ෂ 128) හා විදේශීය මුදල් හා ශේෂවල (රුපියල් දශ ලක්ෂ 216) සංයුක්ත බලපෑමක් වශයෙන් ජාත්‍යන්තර සංචිතය රුපියල් දශ ලක්ෂ 150 දක්වා වැඩි විය. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි වැඩි වීම කෙරෙහි ජපාන යෙන් ණය මුදල (රුපියල් දශ ලක්ෂ 331) භාවිතා කිරීමද හේතු විය. විදේශීය මුදල් හා ශේෂ පහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ සම්පස්ථ ණය ආපසු ගෙවීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය සඳහා සේවා ගාස්තු ගෙවීම් හා අතිකුත් ණය පියවීම් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

වර්ෂය තුළදී අනිකුත් වත්කම් හා ගිණුම් අංශයන්හිද රුපියල් දශ ලක්ෂ 162 ක පහළ යාමක් වාර්තා විය.

වත්කම් අංශය ගත්කළ, එහි ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ තැන්පතු වගකීම්වල (රුපියල් දශ ලක්ෂ 1,757) හා භාවිතයේ පවතින නෝට්ටුවල (රුපියල් දශ ලක්ෂ 1,317) වැඩි වීමය. තැන්පතු වගකීම්හි කැපී පෙනෙන වැඩි වීමට මූලික හේතුව වූයේ 1983 දෙසැම්බර් මැද භාගයේ සිට ඉහළ නංවන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවන්ය. වෙළෙඳ බැංකු මගින් පෞද්ගලික අංශය වෙත අනුමත කල එහෙත් පාවිච්චි නොකළ අයිරාවන් සඳහා අය කරනු ලබන සියයට 16 ක සංචිත අවශ්‍යතා නිසා තැන්පතු වගකීම්හි වර්ධනය තවදුරටත් කැපී පෙනුනි. විදේශීය ණය ගැනීම් (රුපියල් දශ ලක්ෂ 22) හා ප්‍රාග්ධන ගිණුම් (රුපියල් දශ ලක්ෂ 1) හිද සුළු වැඩි වීම් වාර්තා කළේය. අනිකුත් වත්කම් හා ගිණුම් පහළ යාමට තුඩුදුන් එක් හේතුවක් වූයේ මහ බැංකුවේ ලාභ ප්‍රමාණයෙන් කොටසක් රජයට පවරා දීමය.

**ජාතික ණය සැළසුම—1983**

1983 සඳහා වූ ජාතික ණය සැළසුමක් සමග ලංකාව ණය සැළසුම්කරණයෙහි තෙවැනි වසරට ඇතුළත් විය. පසුගිය වර්ෂ දෙකෙහි මෙන් ණය සැළසුම රාජ්‍ය සංස්ථාද ඇතුළුව පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු මගින් දෙන ණය පිළිබඳව ක්‍රියාකර ඇත. රටෙහි පවතින ආර්ථික ක්‍රියාවලියන් සඳහා ණය ප්‍රමාණවත් අයුරින් සැපයීමද සැළසුම් විසින් අවධානයට ලක්කොට ඇත. මේ අනුව, 1983 ණය සැළසුමෙහි ප්‍රධාන අරමුණු දෙක වූයේ, පෞද්ගලික අංශය වෙත සපයනු ලබන බැංකු ණය ක්‍රමවත් කිරීම මගින් ආර්ථිකයේ වැදගත් සහ වැඩෙන අංශයනට ප්‍රමාණවත් ණය පහසුකම් ඇති කිරීම සහ දෙවනුව ණය මුදල් ගලා යන දිසාව හඳුනා ගැනීම හා ප්‍රමුඛතා අංශයනට වැඩි ණය ප්‍රමාණයක් යොමු කිරීමත්ය.

පසුගිය ණය සැළසුම් දෙකෙහිදී මෙන් ඇස්තමේන්තු කළ මූර්ත වර්ධනය, උද්ධමන අනුපාතිකය සහ ආර්ථිකයේ වැඩිවන මූල්‍යකරණය සැළකිල්ලට ගනිමින් මූල්‍ය ඉලක්කයන් ඇස්තමේන්තු කරන ලදී. විදේශීය අංශයෙහි සිදුවීමට හැකිව පැවති වර්ධනයන් සළකා බලමින් මෙම මූල්‍ය ඉලක්කයන් ආර්ථිකයෙහි අනුදත් ණය ප්‍රමාණය බවට පරිවර්තනය කරනු ලැබීය. මින් රජයේ ණය අවශ්‍යතාවයන්ට ඉඩ සැළසීමෙන් පසුව ඉතිරි සම්පත් පෞද්ගලික අංශය සඳහා වෙන් කරන ලදී.

මේ අනුව, 1983 වර්ෂයේ අවසානයේදී පවතින, පෞද්ගලික අංශයේ නොපියවූ ණය රුපියල් දශ ලක්ෂ 31,408 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. මෙය 1982 අවසානයේදී පැවති මට්ටමට වඩා සියයට 24 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. අංශයන් සඳහා ණය බෙදා වෙන් කිරීමේදී කෘෂිකර්මය, කර්මාන්ත හා අපනයන ප්‍රමුඛ අංශයන් වශයෙන් තවදුරටත් පවත්වා-ගෙන යනු ලැබීය. කෘෂිකාර්මික අංශය සඳහා වෙන් කල ණය මුදල රුපියල් දශ ලක්ෂ 3,902 ක් වූ අතර, එය පසුගිය වර්ෂයේ ප්‍රමාණයට වඩා සියයට 26 ක වැඩි වීමක් පෙන්නුම් කළේය. කාර්මික අංශය සඳහා වෙන්කළ රුපියල් දශ ලක්ෂ 8,041 ප්‍රමාණය වර්ෂය තුළ සියයට 22 ක වැඩි වීමක් දැක්වීය. 1983 ණය සැළැස්මේලා අපනයන ඉතාමත් වැදගත් අංශය වශයෙන් සැළකිල්ලට ගත් අතර, එම අංශය සඳහා සැළසුම් කරන ලද ණය මුදල රුපියල් දශ ලක්ෂ 4,414ක් වූ අතර, එය සියයට 30 ක වැඩි වීමකි. 1982 වර්ෂයේදී පිළිවෙලින් අපනයන හා කාර්මික අංශයන් සඳහා පැවති සියයට 25 ක් හා 13 ක් වූ ආංශික ණය ප්‍රමාණයන් 1983 දී සියයට 26 හා 14 දක්වා අනුපිළිවෙලින් වැඩි කරනු ලැබීය. කෘෂිකාර්මික අංශය සඳහා වූ සියයට 12 ක් වන ණය ප්‍රමාණය නොවෙනස්ව පැවතුණි. ආනයන අංශය සඳහා නොපියවූ ණය රුපියල් දශ ලක්ෂ 4,157 ක් වශයෙන් ඇස්තමේන්තු කළ අතර, එය සියයට 9 ක වැඩි වීමක් දැක්විය.

ආංශික ණය සම්බන්ධව පවතින කාලීන වෙනස්වීම් සැළකිල්ලට ගනිමින් කාර්තුමය වශයෙන් ණය බෙදා වෙන් කිරීම කරන ලදී. අංශයන් සඳහා නියත වශයෙන් යොදා ගත් ණය ප්‍රමාණයන් සැළැස්මේ ඉලක්කයන්ට අනුකූල විය. නියත වශයෙන් පැවති මුළු ණය ප්‍රමාණය සැළසුම් කළ ඉලක්කයෙන් වෙනස් වූයේ ආන්තික වශයෙන් සියයට 1.5 කින් පමණි.

**මූල්‍ය ප්‍රතිපත්ති**

1982 වර්ෂය තුළදී අත්කර ගත් සැළකිය යුතු මූල්‍ය සහ මිළ ස්ථාවරත්වය, 1983 වර්ෂය මුල් භාගය තුළදී දැඩි මූල්‍ය ප්‍රතිපත්තීන්හි ලිහිල් කිරීමට තුඩු දුනි. 1983 වර්ෂයේ මුල් භාගය තුළ හඳුන්වා දෙන ලද නව මූල්‍ය ප්‍රතිපත්තීන් මූලික වශයෙන් ප්‍රමුඛතා අංශවල කටයුතු කෙරෙහි ඉහළ පොලී අනුපාතිකයන්ගේ අයහපත් බලපෑම අඩුකරලීම කෙරෙහි හා ආර්ථිකයේ නිෂ්පාදනය වැඩි කරලීම කෙරෙහි යොමු විය. මේ අනුව, පොලී අනුපාතික ව්‍යුහයෙහි සැළකිය යුතු අන්දමේ නම්‍යතාවයක් ඇති කරමින් එමගින් පොලී අනුපාතික ව්‍යුහය වෙනස් වන ආර්ථික අවශ්‍යතාවයන්ට අනුකූල වන අන්දමට සැකසීමේ අරමුණ ඇතිව මහ බැංකුව පොලී අනුපාතික ව්‍යුහය සංශෝධනය කරන ලදී.

මෙම අරමුණු අත්කර ගැනීමෙහිලා ප්‍රථම පියවර වශයෙන්, මහ බැංකුව 1983 මාර්තු මස 24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 14 සිට සියයට 13 දක්වා අඩු කරන ලදී. මෙම සංශෝධනය සමගම 1983 මාර්තු මස 30 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සියයට 21–30 දක්වා පරතරයක පැවති දණ්ඩන පොලී අනුපාතික ව්‍යුහය වෙනුවට සියයට 20 ක ඒකීය පොලී අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. මෙම ප්‍රතිපත්තීන් නිසා වෙළෙඳ බැංකුවලට සිය ණය දීමේ පොලී අනුපාතිකයන් අඩු කරලීමට සානුබලයක් ලැබෙතැයි බලාපොරොත්තු විය.

මෙම වෙනස්කම් වලට අමතරව, ප්‍රමුඛතා අංශවලට විශේෂයෙන්ම, අපනයන අංශයට, ණය මුදල් ලබා දීම සීඝ්‍ර කරවන අන්දමේ ප්‍රතිපත්ති රැසක්ම හඳුන්වා දෙන ලදී. මේ අනුව, මාර්තු මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පූර්ව අපනයන කටයුතු සඳහා මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට දෙන ප්‍රතිමූල්‍ය ණය වෙනුවෙන් අය කරනු ලබන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 12 සිට 11 දක්වා අඩු කරන ලදී. මේ අතර, මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ සියළුම කාණ්ඩ සඳහා දෙනු ලබන මැදි හා දිගු කාලීන ණය වෙනුවෙන් අය කරනු ලබන පොලී අනුපාතිකය සියයට 1 කින් අඩු කරන ලදී. මෙම සහනදායී පියවරවලට අමතරව, සම්ප්‍රදායික නොවන අපනයන අංශය සඳහා (ඛනිජ තෙල් නිෂ්පාදන, ඇඟලුම්, මැණික් සහ මත්ස්‍ය නිෂ්පාදන හැරුණකොට) පරිපූරක ප්‍රතිමූල්‍ය ක්‍රමයක් 1983 මාර්තු මස 16 වැනි දින හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම හඳුන්වා දුන් කාලයේදී අපනයන කරුවන් විසින් වෙළෙඳ බැංකු වලට භාර දෙන පොරොන්දු නෝට්ටු මහ බැංකුව වර්ෂයකට සියයට 8.5 කට වට්ටම් කරන ලද අතර, වෙළෙඳ බැංකු වලට වර්ෂයකට සියයට 12 ට නොවැඩි අනුපාතිකයකට වට්ටම් කිරීමට ඉඩ දෙන ලදී. 1983 මාර්තු මස 24 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මේ යටතේ වූ වට්ටම් අනුපාතිකය වර්ෂයකට සියයට 7 දක්වා අඩු කරන ලද අතර, වෙළෙඳ බැංකු වලට වර්ෂයකට සියයට 11 ක පොලියකට වට්ටම් කිරීමට ඉඩ දෙන ලදී. 1983 ජුනි මස 9 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පසුව සඳහන් කරන ලද වට්ටම් අනුපාතිකය වර්ෂයකට සියයට 9.75 දක්වා තවදුරටත් අඩු කරන ලදී. කෙසේ වුවද, පූර්ව අපනයන කටයුතු සඳහා පොරොන්දු නෝට්ටුවෙහි සම්පූර්ණ මුහුණත අගයට සමාන අත්තිකාරමක් ලබා දීම සඳහා ඇපයක් ලෙස වෙළෙඳ බැංකු වෙත පොරොන්දු නෝට්ටු ලබා දී ඇති අවස්ථා වලදී අය කෙරෙන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 10.8 ක් වේ. 1933 ජූලි මාසයේදී, රබර්, පොල් සහ ඇතැම් මත්ස්‍ය නිෂ්පාදිතයන් ඇතුළත් වන පරිද්දෙන්ද, ඔක්තෝබර් මාසයේදී නැවත අපනයන කරන දියමන්ති ඇතුළත් වන පරිද්දෙන්ද මෙම ක්‍රමය යටතේ දෙන පහසුකම් පුළුල් කරන ලදී. අපනයන අංශය දිරි ගැන්වීම සඳහා මහ බැංකුව විසින් ගන්නා ලද තවත් පියවරක් වූයේ විශේෂයෙන් අපනයන මූල්‍යකරණය සහ පොදුවේ අපනයන වර්ධනය සම්බන්ධයෙනුත්, අපනයන කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න සළකා බැලීමේ අරමුණ ඇතිව මහ බැංකුව තුළ පිහිටුවන ලද අපනයන ණය උපදේශක ඒකකයයි (Export Credit Cell). මෙම අපනයන ණය උපදේශක ඒකකය මගින් අපනයන කරුවන්ගේ ප්‍රශ්න සළකා බලා ඒවාට නිසි පිළියම් ලබා දීමට ප්‍රයත්න දරනු ඇතැයි බලාපොරොත්තු වේ.

විදේශීය ආයතන මගින් දෙනු ලබන මැදි හා දිගුකාලීන ණය අරමුදල් සඳහා වූ පිරිවැයට ගැලපෙන පරිද්දෙන් 1983 අප්‍රේල් මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මැදි හා දිගු කාලීන ණය අරමුදලෙන් වර්ගීකරණ II යටතේ අපනයන දිරි ගැන්වීම සහ වර්ධනය සඳහා දෙනු ලබන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ප්‍රමාණය සියයට 100 සිට සියයට 70 දක්වා අඩු කරන ලදී. මේ අතර, එම අරමුදලෙන් වර්ගීකරණ III සහ IV යටතේ දෙන ණය සඳහා ණය දෙන ආයතනවලට තබා ගැනීමට අවසර දී ඇති පොලී පරතරය සියයට 5 සිට සියයට 4 දක්වා අඩු කරන ලදී.

1983 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිද්දෙන් රුපියල් සුරැකුම්පත් නිකුත් කිරීමේ නියමයන් සහ කොන්දේසි සංශෝධනය කරන ලදී. මේ අනුව, අළුතින් නිකුත් කෙරෙන රුපියල් සුරැකුම්පත්වල කල් පිරීමේ කාලය අවුරුදු 3 සිට 5 දක්වා දීර්ඝ කරන ලද අතර, පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 16 සිට 14 දක්වා අඩු කරන ලදී.

අපනයන අංශයෙන් ණය මුදල් සඳහා ඇතිවූ දැඩි ඉල්ලුම නිසා වෙළෙඳ බැංකුවලට තව දුරටත් සහන සැළසීමේ අරමුණ ඇතිව එම බැංකුවලට දුන් මුළු ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සීමාව 1983 ජූනි 1 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් දශ ලක්ෂ 590 සිට රුපියල් දශ ලක්ෂ 1,200 දක්වා වැඩි කරන ලදී. මේ සමගම, පූර්ව අපනයන කටයුතු සඳහා වූ ණයෙහි පිරිවැය අඩුකිරීමේ අරමුණ ඇතිව ඒ සඳහා දෙන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් වෙනුවෙන් අය කරන පොලී අනුපාතිකය වර්ෂයකට සියයට 11 සිට සියයට 10 දක්වා අඩු කරන ලද අතර වෙළෙඳ බැංකු වලට තබා ගැනීමට අවසර දී ඇති පොලී පරතරය සියයට 4 සිට 3 දක්වා අඩු කරන ලදී. 1983 සැප්තැම්බර් 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අපනයන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සීමාව තවදුරටත් සියයට 10 කින් වැඩි කරන ලදී.

1983 දෙවැනි භාගය තුළ අත්දුටු මූල්‍ය සහ ණය කටයුතු මූලික වශයෙන් වර්ෂයේ මුල් භාගය තුළදී හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තීන්ගේ සහ ඇතැම් දුරකට ජූලි මාසයේ වූ කලබලවල බලපෑම නිසා ඇතිවූ ඒවා විය. ණයෙහි පිරිවැය අඩුවීම හේතුකොටගෙන වර්ෂයේ දෙවැනි භාගය තුළදී පෞද්ගලික අංශයේ ණය සඳහා ඉල්ලුම සැළකිය යුතු ලෙස වැඩි විය. අගෝස්තු මාසය අවසාන වනවිට පෞද්ගලික අංශයේ ණය සඳහා වූ ඉල්ලුමේ වැඩිවීම වර්ෂයේ වාර්තා වූ ඉහළම මට්ටමට ලඟා වුනි. පෙර නොවූ විරූ ලෙස වැඩිවූ ණය නිසා ආර්ථිකයේ උද්ධමන වේගය වැඩි වූයෙන් ඒ සඳහා නිසි ක්‍රියා මාර්ග ගැනීමේ අවශ්‍යතාව ඇති විය. මෙවැනි පසුබිමක් යටතේ ණය මුදල්වල ශීඝ්‍ර වැඩිවීම අඩු කිරීමේ අරමුණ ඇතිව, තාවකාලික පියවරක් වශයෙන්, 1983 නොවැම්බර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පෞද්ගලික අංශයට දෙන වෙළෙඳ බැංකු අත්තිකාරම් සම්බන්ධයෙන් ණය සීමාවක් පනවන ලදී. මේ අනුව, බැංකු මගින් 1983 නොවැම්බර් 1 වැනි දින හෝ ඊට පසුව පෞද්ගලික අංශයට දෙන ණය ප්‍රමාණය 1983 ඔක්තෝබර් 31 වැනි දිනට දෙන ලද සහ එදිනට නොපියවා පැවති ණය ප්‍රමාණය නොඉක්ම වන්නට වග බලා ගන්නා ලෙස වෙළෙඳ බැංකු වලින් ඉල්ලා සිටින ලදී. කෙසේ වුවද, මෙම සීමාව තුළ ණය බෙදා හැරීමේදී විශේෂයෙන් සඳහන් කරන ලද ප්‍රමුඛතා අංශවලට විශේෂ සැළකිල්ලක් දක්වන්නට උපදෙස් දෙන ලදී.

පෞද්ගලික අංශයේ ණය සඳහා වූ වෙළෙඳ බැංකු ණය සීමාව නොවැම්බර් මස 30 වැනි දිනදී ඉවත් කරන ලද අතර, ඒ වෙනුවට වඩා සම්ප්‍රදායික මූල්‍ය උපකරණයන් හඳුන්වා දෙන ලදී. මේ අනුව ඉල්ලුම් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් සියයට 14 සිට සියයට 16 දක්වා වැඩි කරන ලද අතර, කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු සඳහා වූ අවශ්‍යතාවයන් සියයට 6 සිට සියයට 8 දක්වා වැඩි කරන ලදී. මීට අමතරව, 1983 නොවැම්බර් මස 16 වැනි දින සිට ප්‍රථම වරට, පෞද්ගලික අංශය සඳහා වෙළෙඳ බැංකු විසින් අනුමත කර ඇති අයිරා පහසුකම් වලින් ප්‍රයෝජනයට නොගත් ශේෂයන් වෙනුවෙන් සියයට 16 ක සංචිත අනුපාතයක් මහ බැංකුව වෙත තැබිය යුතු බවට නිර්දේශ කරන ලදී. තවද, නොවැම්බර්

මස 14 වැනි දින සිට දණ්ඩන පොලී අනුපාතිකය යටතේ මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට දෙන ණය පහසුකම්, ඒ සඳහා තබන ඇපයන්ගෙන් සියයට 90 සිට සියයට 50 දක්වා අඩු කරන ලද අතර, නොවැම්බර් 22 වැනි දින සිට එය තවදුරටත් සියයට 25 දක්වා අඩු කරන ලදී. නොවැම්බර් 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දණ්ඩන පොලී අනුපාතිකය යටතේ දෙන අත්තිකාරම් මුළුමනින්ම අත්හිටුවන ලද අතර, ඒ අනුව තාවකාලික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සඳහා මහ බැංකු පොලී අනුපාතිකය යටතේ වෙළෙඳ බැංකුවලට හිමි කොටස් ඉක්ම වන පරිද්දෙන් ණය නොගන්නා ලෙස වෙළෙඳ බැංකු වලට දන්වන ලදී.

1983 අත්දුටු මූල්‍ය ප්‍රසාරණය, වැඩි වශයෙන්ම පෞද්ගලික අංශයට දෙන ලද ණය පෙර නොවූ විරූ ලෙස වැඩිවීම නිසා ඇතිවූවක් විය. වර්ෂයේ අවසාන මාස දෙක තුළදී විදේශීය සම්පත් සැළකිය යුතු ලෙස වැඩිවීම මෙම මූල්‍ය ප්‍රසාරණය තවදුරටත් වැඩි කිරීමකට හේතු විය. මේ හේතුකොටගෙන ණය හා මූල්‍ය වර්ධන අනුපාතිකයන් වර්ෂය සඳහා නියම කර ගන්නා ලද ඉලක්කයන්ගෙන් වෙනස්වී යාමත් දක්නට ලැබුණි. කෙසේ වුවද, වර්ෂයේ දෙවැනි භාගය තුළ ක්‍රියාත්මක කරන්නට යෙදුන මූල්‍ය ප්‍රතිපත්තීන් නිසා ණය වල වූ සීඝ්‍ර වර්ධනය අඩුවූ අතර, එමගින් මූල්‍ය ප්‍රසාරණය සියයට 22 ක මට්ටමක රඳවා ගැනීමට හැකිවිය.